සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

21 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

සිංහල භාෂාව හා සාහිත්‍යය I,II
சிங்களமொழியும் இலக்கியமும் I,II
Sinhala Language and Literature I,II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **අත පයිය නම් බත නොවරදින බව** පැවසුවෝ පුරාණ පඬිවරු ය.
(1) සිඟමන් ඉල්ලීමෙන් ආහාර ලැබෙන බව
(2) කුඹුරු කෙටූ කල බත් ලැබෙන බව
(3) වැඩ කිරීමෙන් ලාභ උපයාගත හැකි බව
(4) උත්සාහය ඇත්නම් ජයගත හැකි බව

2. තම මිතුරාගේ **බත්පතට වැලි දැමීම** නොකළ යුතුව තිබුණු දෙයක් බව ඔහුට අවබෝධ වන විට බොහෝ කල් ඉකුත්ව තිබුණේ ය.
(1) ආහාරය අනුභව කළ නොහැකි තත්ත්වයට පත් කිරීම
(2) ලැබෙන්නට ගිය ලාභයට හානි කිරීම
(3) අපහසුතාවට පත් කිරීම
(4) කළ උපකාර අමතක කර දැමීම

3. අකලංකට **සෙනසුරා ලබා** ඇතැයි ඔහුගේ මිතුරෝ පවසති.
(1) යහපත් කාලයක් උදා වී
(2) මංගල යෝජනාවක් ලැබී
(3) අයහපත් කාලයක් උදා වී
(4) මානසික කම්පනයට පත් වී

● අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. අන් අයගේ අදහස්වලට සවන් නොදී ………………… ක්‍රියා කිරීම යහපත් ගුණාංගයක් නො වේ.
(1) අත්තනෝමතික ව
(2) පරාර්ථකාමී ව
(3) නිද්‍රාශීලී ව
(4) ඊර්ෂ්‍යාපරවශ ව

5. ගරු මර්සිලින් ජයකොඩි පියතුමා සියලු දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ ………………… කිතුනු පියතුමෙකි.
(1) අනභිභවනීය
(2) සම්මානනීය
(3) ප්‍රහර්ෂණීය
(4) අතිරමණීය

6. සාහිත්‍ය පොතපතට ………………… වුණු පුද්ගලයා දැනුම් කෝෂ්ඨාගාරයකි.
(1) ආසක්ත
(2) විනිර්මුක්ත
(3) වියුක්ත
(4) සංයුක්ත

7. අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) නිලය, නිවටයා, නිවස, නිර්මල
(2) කැලල, කැවුම්, කැපීම, කැලය
(3) පදය, පදිංචිය, පහන, පරතරය
(4) විධානය, විනය, විනීත, විපරම

8. අර්ථ හීන කොටසක් සහිත යුගල පදයක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   (1) වට්ටිපෙට්ටි රැගෙන සියල්ලෝ ම වාහනයට නැඟ ගත්හ.
   (2) වැඩිපුර මුදල්හදල් ඇති අයට කරදර ද වැඩි ය.
   (3) හොඳ සිරිත්විරිත් පුරුදු කිරීම යහපත් දරුවන්ගේ ලක්ෂණයකි.
   (4) පොතපත කියවීමෙන් ඥානය වැඩි වේ.

9. ඉස්පිල්ල, පාපිල්ල, ඇදය සහ ඇලපිල්ල යන **පිල්ලම්** පිළිවෙළින් **නිවැරදි ව** යෙදී ඇති වචන පේළිය තෝරන්න.
   (1) චින්තනය, සරුංගලය, කාලය, නැව
   (2) කිරි, තුලා, පැහැපත්, සාරවත්
   (3) සිසිල, රුවල, කාලය, භාවනාව
   (4) විස්තෘත, නුවණ, තරුව, සැපවත්

- අංක **10** සහ **11** ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති වරණය තෝරන්න.

10. (1) ත්‍යාග ප්‍රධානය, දිළිඳු, පිළියෙල, ඤාණය
    (2) ජනගහණය, ස්ථිරසාර, අධිගෘහිත, නිළඹර
    (3) අබිෂේක, පිළිසකර, වැඩමුලුව, ළෙන්ගතු
    (4) ප්‍රාර්ථනාර්ථය, නිශ්චල, කනිෂ්ඨ, ජ්‍යොතිශ්ශාස්ත්‍රය

11. (1) අභිවෘද්ධිය, මාධූර්‍ය්‍යය, ළැදියාව, පිළිබිඹුව
    (2) පසළොස්වක, ප්‍රත්‍යක්ෂ, ශාස්ත්‍රධරත්වය, අභිලාෂය
    (3) දෘෂ්ටිගෝචර, ධර්මිෂ්ට, ඓක්‍යය, ව්‍යවස්ථාව
    (4) පරිකථා, අත්‍යුත්කර්ෂවත්, භක්ත්‍යාධරය, ව්‍යංගාර්ථය

12. විරාම ලකුණු **නිවැරදි ව** යෙදුණු වාක්‍යය තෝරන්න.
    (1) කුඩා ව්‍යාපාර සඳහා, බැංකු පහසුකම් ලබා දෙමු!
    (2) ප.ව: 3.00 ට රැස්වීම, පැවැත්වෙන බව, සභාපතිතුමා දැන්වී ය.
    (3) අහෝ ?ඔහුට යන්න; කියන්න!
    (4) 'පුලතිසිපුර' යනු පොළොන්නරුවට අතීතයේ යෙදුණු නාමය යි.

13. **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) අශ්ව - තුරඟ, ගජ, හය, සෛන්ධව
    (2) ස්වර්ණ - හේම, කාංචන, රන්, කනක
    (3) ලෝකය - ජගත්, දිය, ලෝ, ලෙව්
    (4) සඳ - සිසි, කලාපති, සොමි, හිමකර

14. **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
    (1) ප්‍රවීණ - ඡේක, දක්ෂ, නිපුණ, විචක්ෂණ
    (2) තිර - අචල, නිසල, නිශ්චල, නොසැලෙන
    (3) අඥාන - දද, මුග්ධ, විදග්ධ, මූඪ
    (4) දිශාව - පාර්ශ්වය, දිග, පස, දෙස

- අංක **15** සිට **18** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

15. ජනතාවක් සතු ගීත කලාවක් තිබීමෙන් **ගම්‍යමාන වන්නේ** ඔවුන් සතුව ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් තිබූ බවයි.
    (1) හැඟෙන්නේ (2) උත්පාදනය වන්නේ (3) දෘශ්‍යමාන වන්නේ (4) ඉස්මතු වන්නේ

16. ඉකුත් දශක දෙක තුළ සිංහල ගීතය **භාවපූර්ණ** සුනිශිත සාහිත්‍ය නිර්මාණයක් බවට පත් විය.
    (1) අර්ථ සපිරුණු (2) හැඟීම්වලින් සපිරුණු (3) රසයෙන් සපිරුණු (4) ශබ්ද හා අර්ථවලින් සපිරුණු

17. ඔහු ඉදිරිපත් කළේ **ප්‍රතිෂ්ඨා විරහිත** කරුණු සමුදායකි.
    (1) හේතු සාධක නොමැති
    (2) විශ්වාස කළ නොහැකි
    (3) අදාළ නැති
    (4) ප්‍රත්‍යක්ෂ නැති

18. ලංකාවේ **පුරාකෘත** නිර්මාණ අභිමානවත් ඉතිහාසයකට සාක්ෂි සපයයි.
    (1) කෘතිවලින් පිරුණු (2) ඓතිහාසික (3) පෙර කරන ලද (4) පුරා විද්‍යාත්මක

- අංක **19** ප්‍රශ්නයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන තනි පදය තෝරන්න.

19. ශ්‍රමදානය සඳහා ගම්වැසියන් එකතු වූයේ **කිසිවකුගේ බල කිරීමකින් තොරව** ය.
    (1) ස්වෝත්සාහයෙන් (2) ස්වේච්ඡාවෙන් (3) පරාර්ථකාමිත්වයෙන් (4) නිරායාසයෙන්

20. 'අතීතයේ සිට ම බොහෝ පිරිස් දේශගවේෂණයේ යෙදී ඇති බව ඓතිහාසික මූලාශ්‍රය සාක්ෂි දරයි' යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදය වන්නේ
    (1) අතීතයේ (2) දේශගවේෂණයේ (3) ඓතිහාසික (4) සාක්ෂි

The National e-learning Portal for The General Education

21. වැරදි අදහස දෙන වරණය තෝරන්න.
(1) 'දුශ්චරිත' යන වචනයේ 'දුශ්' යනු උපසර්ගයකි.
(2) 'යළි' යනු අවධාරණාර්ථයේ නිපාත පදයකි.
(3) පංකජ යනු නෙළුම්මලට පර්යාය පදයකි.
(4) ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය කොළඹ දී විවෘත කෙරෙයි යනු කර්ම කාරක වාක්‍යයකි.

22. 'නටයි' යන ක්‍රියා පදයේ **උත්තම පුරුෂ, අතීත කාල, බහු වචන** රූපය ඇතුළත් වරණය තෝරන්න.
(1) නැටීය (2) නැටූහ (3) නැටූහු (4) නැටූමු

23. 'වහා එන්න' යන වාක්‍යයේ '**වහා**' යනු
(1) ක්‍රියා විශේෂණ නිපාතයකි. (2) සීමාව හැඟවීමේ නිපාතයකි.
(3) ආමන්ත්‍රණය හඟවන නිපාතයකි. (4) පද සම්බන්ධ කිරීමේ නිපාතයකි.

24. 'සුමිහිරි' යන පදයේ '**සු**' යන උපසර්ගය
(1) පදයේ අර්ථය වෙනස් කරයි. (2) පදයට විරුද්ධ අර්ථයක් ගෙන දෙයි.
(3) පදයේ අර්ථය අනුව ම පවතී. (4) පදයේ අර්ථය වැඩි කරයි.

25. මුලින් දැක්වෙන පදය නිවැරදි ලෙස **විසන්ධි** කර ඇති වරණය තෝරන්න.
(1) අත්‍යන්ත - අති + අන්ත (2) බුදුකුරු - බුදු + කුරු
(3) මිහින්තල - මිහින් + තල (4) අත්‍යවශ්‍යතාව - අත්‍ය + අවශ්‍යතාව

- අංක **26** සිට **28** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ **තෝරන්න**.

26. නිෂ්ඵල උත්සාහයක් දැරීම
(1) කතාව දෝලාවෙන් ගමන පයින් (2) බීරි අලින්ට වීණා ගායනා කිරීම
(3) විද්දේ හාවට වැදුණේ පඳුරට (4) වත්ත බද්දට දී ඇස්සට දත නියවීම

27. යම් කාර්යයක් ඕනෑවට එපාවට කිරීම
(1) මෝල්ගස් ගිලපු පිඹුරා වගේ (2) උගුඩුවා ඇටි කෙහෙල් කෑවා වගේ
(3) ලෙඩ කපුටා වැල කනවා වගේ (4) හිහන්නගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ

28. අකැමැත්තෙන් යම්කිසි කාර්යයක් සිදු කිරීම
(1) ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ (2) අතු කඩා මොර කන්නා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ (4) උගුරට හොරා බේත් කනවා වගේ

- අංක **29** සිට **31** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) පොත් කියවන්නෝ ලෝකය දිනන්නෝ ය.
(2) ඔහු දක්ෂ ඉංජිනේරුවකු වෙයි.
(3) දිරිය දරුවන් සැමගේ ප්‍රශංසාව ලබයි.
(4) ධාරානිපාත වර්ෂාවත් සමඟ ජලාශයෝ පිරී ඉතිරී යයි.

30. (1) මා මිතුරන් හෙවත් ඔවුහු මට උදව් කරති.
(2) සියලු මිනිස්සු යහපත් පුද්ගලයෝ ද?
(3) පෙදරේරුවෝ ගොඩනැගිල්ල නිමා කරාවි.
(4) පාරේ වැඩට කම්කරුවෝ පැමිණ ඇත.

31. (1) පියා නොහොත් මම මංගල උත්සවයට සහභාගි වන්නෙමු.
(2) පාසල් ළමයින් සඳහා ලියවුණු පොත් රාශියක් ඇත.
(3) දක්ෂ ලේඛිකාවක් වන්නේ කෙසේ ද?
(4) නාවිකයෝ වෙරළට පැමිණෙනු ඇත.

32. තරුපති යන පදය අයත් වන්නේ,
(1) අව්‍යය සමාසයටයි (2) විශේෂණ සමාසයටයි
(3) විභක්ති සමාසයටයි (4) අන්‍යාර්ථ සමාසයටයි

33. උපමාවක් ඇතුළත් කවි පදය තෝරන්න.
(1). ලෙළ දුන් නව තඹ පලු වන් නාදේ

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

34. නූතන ජනගහන වර්ධන වේගය අනුව පෘථිවි තලය මත ඇති ආහාර නිෂ්පාදන ශක්තිය කොතෙක් දුරට මරොත්තු දේ දැයි යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.
(1) ජනගහන වර්ධන වේගය ගැන සලකන විට පෘථිවියේ ඇති ආහාර නිපදවීමේ හැකියාව ඊට සෑහේ ද යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.
(2) ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව මහපොළොව සතු ආහාර නිපදවීමේ හැකියාව අඩු වීම ලෝපුරා සිටින විශේෂඥයින්ගේ සුවිශේෂ අවධානය යොමු වී ඇති කරුණකි.
(3) ජනගහන වර්ධන වේගයත් සමඟ මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩු වීමෙන් ඇති වන ආහාර හිඟය ලෝපුරා සිටින විශේෂඥයින්ගේ අවධානය යොමු වී ඇති කරුණකි.
(4) ජනගහන වර්ධන වේගයට සමාන්තරව මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩුවීමෙන් ඇති වන ආහාර හිඟය පිළිබඳ ව ලෝපුරා සිටින විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත.

35. ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය වන ජල සම්පාදනය උදෙසා මූලික අඩිතාලම වූ වැව් තැනවීම ලංකාවේ රාජ්‍ය පාලකයින්ගේ වැදගත් ම රාජ්‍ය ප්‍රතිපත්තියක් විය.
(1) වී වගාවෙන් රට ස්වයංපෝෂණය කිරීම සඳහා රටට ඇවැසි ජලය සැපයීමට නම් වැව් තැනවීම අත්‍යවශ්‍ය බව එකල ලංකාවේ රාජ්‍ය පාලකයින් තේරුම් ගෙන ඇත.
(2) වී වගාව දියුණු කිරීම මගින් රට සහල්වලින් ස්වයංපෝෂණය කළ හැකි බවත් ඒ සඳහා ජලය ලබා දීමට වැව් තැනවීම අත්‍යවශ්‍ය බවත් රාජ්‍ය පාලකයෝ දැන සිටියහ.
(3) රට සහලින් ස්වයංපෝෂිත තත්ත්වයට ගෙන ඒම සඳහා වී වගාව දියුණු කළ යුතු නම් ඊට අවශ්‍ය ජලය සැපයීම සඳහා වැව් තැනවිය යුතු බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ තේරුම් ගත්හ.
(4) වී වගාව දියුණු කිරීමෙන් රට ස්වයංපෝෂණය කිරීමට නම් වගාවට ඇවැසි ජලය සැපයීම සඳහා වැව් තැනවීම අත්‍යවශ්‍ය කාර්යයක් බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ වටහා ගත්හ.

36. ප්‍රස්තුත මාතෘකාව පිළිබඳ ව මධ්‍යස්ථ ලෙස සංක්ෂිප්තව හා වාස්තවික ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ස්වභාවයයි.
(1) ප්‍රශ්නයට තුඩුදුන් මාතෘකාව පිළිබඳ ව මැදහත්ව කෙටියෙන් හා අපක්ෂපාතීව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ලක්ෂණයයි.
(2) ඉදිරිපත් කරන මාතෘකාව පිළිබඳ ව අපක්ෂපාතීව, කෙටියෙන් හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ලක්ෂණයයි.
(3) කතුවැකිය ලිවීමේදී තෝරාගත් මාතෘකාව පිළිබඳ මැදහත්ව සංක්ෂිප්තව හා යථාර්ථවාදීව කරුණු ඉදිරිපත් කෙරෙයි.
(4) කතුවැකියේ දී තෝරා ගත් මාතෘකාවට අදාළ කරුණු අපක්ෂපාතීව, කෙටියෙන් හා තර්කානුකූලව ඉදිරිපත් කෙරෙයි.

37. ' විභාගය සමත් වුණායින් පස්සේ රස්සාවක් සොයාගන්නවා කියල අරවින්ද කීවා' යන වාක්‍යය ලිඛිත වහරට හැරවූ විට වඩාත් **නිවැරදි වාක්‍යය** දැක්වෙන වරණය තෝරන්න.
(1) විභාගය සමත් වීමෙන් අනතුරුව රැකියාවක් සොයා ගන්නෙමුයි අරවින්ද කීවේ ය.
(2) විභාගය සමත් වුවායින් පසු රැකියාවක් සොය ගන්නා බව අරවින්ද කීවේ ය.
(3) විභාගය සමත් වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නා බව අරවින්ද කීහ.
(4) විභාගය සමත්වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නේ යයි අරවින්ද කියයි.

38. **වැරදි** ප්‍රකාශය සහිත වරණය තෝරන්න.
(1) සාහිත්‍ය නිර්මාණයක් බිහිවන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ප්‍රතිභා ශක්තිය නිසා ය.
(2) සාහිත්‍යයේ දී රසවින්දනය හා නිර්මාණය යන අංග දෙක ම එක හා සමාන වැදගත්කමක් දරයි.
(3) රසවින්දනයට අදාළ සහජ ශක්තිය වාසනාගුණය නම් වේ.
(4) සාහිත්‍යකරුවා සිය නිර්මාණ කාර්යය කෙරෙහි නිරන්තරයෙන් ලබන අභ්‍යාසය ව්‍යුත්පත්තියයි.

39. 'සාහිත්‍යාර්ණවයේ පරතෙර දුටු කෙනකු වශයෙන් වැලිවිට සෝරත හිමියෝ පැසසුම් ලබති' යන වාක්‍යයේ **සාහිත්‍යාර්ණවය** යනු,
(1) සාහිත්‍යය නම් වූ නිධානයයි. (2) සාහිත්‍යය නම් වූ ගංගාවයි.
(3) සාහිත්‍යය නම් වූ සාගරයයි. (4) සාහිත්‍යය නම් වූ ස්වර්ණ මංජුසාවයි.

40. ' බලා සිටු රහන රඟ මඬල කල් බඳ' යන පද්‍ය පාදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සිත් ඇද ගන්නා වූ කාන්තාවන් වේදිකාවේ රඟන ආකාරය බලා සිටින්න.
(2) රංග මණ්ඩලයෙහි කාන්තාවන් නටන ආකාරය හොඳින් දැක ගන්න.
(3) කාලය නොඉක්මවා වේදිකාවේ කාන්තාවන් නටන ආකාරය බලා හිඳින්න.
(4) සිටුවරුන් වේදිකාවේ රංගනයේ යෙදෙන ආකාරය කල් නොඉක්මවා බලන්න.

* *

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

සිංහල භාෂාව හා සාහිත්‍යය I,II
சிங்களமொழியும் இலக்கியமும் I,II
Sinhala Language and Literature I,II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට **(x)** තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන සඤ්ඤක අක්ෂර **දෙකක්** ද මූර්ධජාක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.
(අ) බහුශ්‍රැත (ආ) නිරාකුල

(iii) පහත සඳහන් පද්‍ය ඛණ්ඩ දෙකෙහි තදකළු අකුරෙන් දැක්වෙන පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) විමානයෙන් **බසිනු** මැනවි ස්වර්ණමාලියේ
(ආ) බෝ මළුවක ඇවිළෙන පහන් වැඩික් සේ තුන් සිත නිවී **සැදේවා.**

(iv) පහත සඳහන් පද **දෙක** විසන්ධි කොට ලියන්න.
(අ) පූජෝත්සවය (ආ) නළඟන

(v) පහත සඳහන් (අ) සහ (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි පවතින සදෝෂ වචන **දෙක** නිදෝස් කොට ලියන්න.
(අ) දරුවන්ගේ පෝශණ අවශ්‍යතා පිළිබඳ ව දෙමාපියන් සැලකිලිමත් විය යුතු බව වෛද්‍යවරු පවසති.
(ආ) ගුරුමුෂ්ඨි තබා නොගෙන ඉගැන්වීමෙහි යෙදෙන ගුරුවරයා සමාජයෙහි ගෞරවාදරයට පාත්‍ර වේ.

(vi) පහත සඳහන් වාක්‍ය **දෙක** නිදොස් කොට ලියන්න.
(අ) අක්කා හෝ අය්යා හෝ ශ්‍රමදානයට සහභාගී වෙති.
(ආ) විචාරකයන් බැද්දේගම චිත්‍රපටය ඇගයීමට පාත්‍ර කළහ.

(vii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් නිපාත පද **දෙක** තෝරා ලියන්න.
උදේ පටන් පැවැති අධික වර්ෂාපතනය නිසා ක්‍රීඩා තරගයට බාධා ඇති විය.

(viii) මෙහි (අ) සහ (ආ) කොටස්වල එන කර්මකාරක වාක්‍ය **දෙක** කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) ප්‍රතිමා ශිල්පීන් විසින් ප්‍රදර්ශන තරගය සඳහා ප්‍රතිමා කිහිපයක් ඉදිරිපත් කෙරෙයි.
(ආ) මාර්ටින් වික්‍රමසිංහ විසින් ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කෙරිණි.

(ix) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙක** තෝරා ලියන්න.
චිත්තාකර්ෂණීය නැටුම් සංදර්ශනයක් ඉදිරිපත් කළ ඇය සුප්‍රකට නිළියකි.

(x) දළදා මාලිගාවේ පුදසිරිත් ආශ්‍රිත ජන වහරට අයත් පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) හේමකද (ආ) අවුල්පත

(ලකුණු 20 යි)

**2.** පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නිවෙස්, කර්මාන්තශාලා, ව්‍යාපාරික ස්ථාන ආදියෙහි රැස්වන කුණුකසළ අවට පරිසරයට බැහැර කිරීමේ අශෝභන ක්‍රියාවට ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් නැඹුරු ව සිටිති. මෙලෙස තැන තැන ගොඩගැසෙන කුණු ගොඩවල් පරිසරයට මෙන් ම මිනිසුන්ගේ සෞඛ්‍යයට ද බලවත් තර්ජනයකි. මේ තත්ත්වයට හේතු වී ඇත්තේ කුණු කසළ බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නැතිකමටත් වඩා ඒ සම්බන්ධයෙන් ජනතාව දක්වන නොසැලකිල්ල බව පෙනේ. එබැවින් කුණුකසළ බැහැර කිරීමේ විධිමත්, සෞඛ්‍යාරක්ෂක, පරිසර හිතකාමී, ක්‍රමෝපාය හඳුන්වාදීමට සමගාමී ව ජනතා ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම ද වැදගත් ය.

(ආ) පාසල් ගොඩනැගිලි, ලිබඩු, විද්‍යා උපකරණ, පුස්තකාල පහසුකම්, නිල ඇඳුම්, පෙළපොත් හා ශිෂ්‍යාධාර පහසුකම් ආදි විවිධාංග ඔස්සේ මෙරට නිදහස් අධ්‍යාපනය උදෙසා රජය විශාල මුදලක් වැය කරයි. මින් ප්‍රයෝජන ලබා ගෙන විවිධ ක්ෂේත්‍රවලින් බිහිවන උගතුන් වැඩි වැටුප් හා වරප්‍රසාද අපේක්ෂාවෙන් විදේශගත වීමේ ප්‍රවණතාවක් මෙකල දැකිය හැකි ය. මොවුන් අතුරෙන් බහුතරයක් ඒ රටවල ම ස්ථිර ව පදිංචි වන බව ද වාර්තා වේ. නිදහස් අධ්‍යාපනයේ ඵල ලබන සියලු දෙනාගේ යුතුකම වන්නේ තම මව්බිමෙහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ය.

(ඉ) නිවාස, කර්මාන්තශාලා, මංමාවත් හා වෙනත් පොදු ස්ථාන ආලෝකකරණය සඳහාත්, විවිධ මට්ටමේ යාන්ත්‍රික කටයුතු සඳහාත්, භාවිත කෙරෙන ප්‍රධානතම බලශක්ති මූලය වන විදුලිය පරිභෝජනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. අවධිමත් පරිභෝජන රටා හා වංචනික ක්‍රියා නිසා අපතේ යන විදුලි ඒකක ප්‍රමාණය ද සුළුපටු නො වේ. අධික විදුලි බිලක් ගෙවීමෙන් හා නිතර නිතර විදුලි කප්පාදුවට මුහුණ දීමෙන් මෙහි ප්‍රතිවිපාක විඳින්නෝ පොදු මහජනතාව ය. මේ අනුව වංචනිකයනට දැඩි දඬුවම් පැමිණවීමත්, අරපිරිමැස්මෙන් විදුලිය පරිභෝජනයට මහජනතාව පෙලඹවීමත් කඩිනමින් කළ යුතුව තිබේ.

(ඊ) ගුවන්විදුලිය මෙරට ප්‍රධානතම විද්‍යුත් මාධ්‍ය වශයෙන් පැවැති සමය ළමා ගී සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බව කියැ වේ. ඒ, එකල ළමා මනසට උචිත හා චරිත සංවර්ධනයට ඉවහල් වූ අරුත්බර ළමා ගී නිර්මාණ සම්භාරයක් දායාද වීම නිසා ය. වර්තමානයේ ගුවන්විදුලි නාලිකා විශාල ප්‍රමාණයක් හා ප්‍රබලතම විද්‍යුත් මාධ්‍ය ලෙස රූපවාහිනිය ක්‍රියාත්මක වුවත් ළමා

**3.** පහත දැක්වෙන ඡේදය වචන **50 - 60** අතර ගණනකින් යුක්ත වන සේ **සාරාංශ කොට ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

අපේ පුරෝගාමී ඉතිහාසඥයකු හා පුරා විද්‍යාඥයකු වන මහාචාර්ය පරණවිතාන මහතා කියන්නේ ඉතිහාසය පවා හැඩගැස්වීමට වෘක්ෂලතාදිය හේතුකාරක වන බවයි. මනුෂ්‍යාවාසයක් පවා ඇතිව තිබෙන්නේ අනිවාර්යයෙන් ම වෘක්ෂලතාදිය නොඅඩු ව වැවෙන ප්‍රදේශ පාදක කොටගෙන බව එතුමා අපට ඒත්තු ගන්වයි. 'රටක වෘක්ෂලතාදිය ඇතිවෙන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධකයන් මුල්කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයත් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතුයි. මනුෂ්‍යාවාසයක් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. පරිසරය ද, වෘක්ෂලතාදිය ද නිසියාකාරව ආරක්ෂාවීම ජන ජීවිතයෙහි පැවැත්මට මහත් ම ආධාරයක් වන බව ඉන් ගම්‍යමාන වේ. එහෙත් වෘක්ෂය පිළිබඳ පුරාණයේ තිබූ සැලකිල්ල අද දින බොහෝ සේ මිය ගොස් ය. වෘක්ෂ විනාශය අද දින ජාතික ප්‍රශ්නයක් බවට පත් ව ඇත.

අවිචාරවත් ලෙස වෘක්ෂ විනාශ කිරීම හේතු කොට ගෙන ලක්දිව ඇතැම් පෙදෙස් කාන්තාර වීමේ ලකුණු පළ කරන බව සඳහන් වේ. කෙළවරක් නොමැති ව කෙරෙන්නාවූ වෘක්ෂ විනාශය තුළින් ජනිත කරන්නාවූ අයහපත් ප්‍රතිඵල අනාගතයේදී අපට භුක්ති විඳීමට සිදුවනු ඇතැයි දේශීය මෙන් ම විදේශීය බුද්ධිමත්තු ද පෙන්වා දී ඇත්තාහ. මෙහිදී සිහිපත් කළ යුතු විදේශීය පඬිවරයකු නම් ආර්.එල්.බ්‍රෝහියර් මහතාය. ලංකාවේ අනතුරට පත් වනාන්තර පිළිබඳ ව ඔහු කතා කොට ඇත්තේ වේදනාබර හදවතකිනි. ආධ්‍යාත්මික වශයෙන් ඉතා ප්‍රබෝධජනක වූ ද, ඇසට ඉතා සංතෘප්තිකර දර්ශනයක් වූ ද, වනාන්තර ඉතා ආසන්න අනාගතයේදී ම පුරාවෘත්තයක් බවට පත් වේයැයි යනුවෙන් බ්‍රෝහියර් මහතා අනතුරු අඟවයි.

(ලකුණු 10 යි)

**4.** පහත දැක්වෙන **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට** උත්තර සපයන්න.

දහතුන් වැනි සියවසේ දී සිදු වූයේ රජරටේ බලය අහිමි වූ පාලකයින් මායා රටට යාම නො වේ. රාජධානිය මාඝ විසින් අල්ලාගනු ලැබූ පසු මායා රටේ සහ රෝහණයේ ප්‍රාදේශික අධිපතීන් පිරිසක් ඒ විදේශිකයන්ට පක්ෂපාත නො වී සිටියහ. ඔවුහු ස්වාධීන පාලකයන් හැටියට ක්‍රියා කරන්නට පටන් ගත්හ. නෙරපා දමනු ලැබූ කුලීනයනුත් ඔවුන්ගේ දාසයනුත් රජරටේ දී විඳින්නට සිදු වුණු පීඩාවලින් බේරී ජීවත් වන්නට පැමිණි සෙස්සනුත් නිසා මේ පෙදෙස්වල ජනගහනය වැඩි වී ගියේ ය. ඒ වන විට තෙත් කලාපයේ තිබුණු කුඹුරු ප්‍රමාණය සීමා සහිත වූ හෙයින්, මේ වැඩි වූ ජනසංඛ්‍යාවට එයින් ආහාර සැපයීම උගහට විය. එහෙයින් මෙතෙක් වගා නොකර තිබුණු ලොකු කැලෑ යායවල් එළි කර කුඹුරු බවට හෝ වතු බවට හරවන ලදි. මේ වනාහි I පරාක්‍රමබාහු රජු මායා රටේ පමණක් රජකම කරද්දී පස්දුන් කෝරළේ වගුරු බිම් අස්වැද්දීමෙන් පටන් ගත් වැඩ පිළිවෙළ වඩා පුළුල් ලෙස දිගට ම කර ගෙන යෑමකි. අලුත් ප්‍රදේශයේ ස්වභාවයට හැඩ ගැසෙන්නටත් කෑම් බීම් අතින් අලුත් පුරුදු ඇති කර ගන්නටත් වියළි කලාපයේ සිට තෙත් කලාපයට සංක්‍රමණය කළ අයට සිදු වූයේ ය. රජරට සිටිය දී පුරුදු ව සිටි ගිතෙල් සහ තලතෙල් මෙහි සුලබ නො වීය. එහෙයින් පොල්තෙල්වල රස බලන්නට ඔවුන්ට සිදු විය. ලොකු බිම් යායවල පොල් වගා කරන ලදි. II පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී කළුතර සහ බෙන්තොට අතර වෙරළබඩ තීරය එළි කර පොල් වගා කරන ලද බව කියා තිබේ. එකල පොල් වෙළෙඳ බඩුවක් හැටියට පිටරට යවන ලද්දේ දැයි දැන ගන්නට නැත. එහෙත් කුරුඳු ගසත් එහි සුවඳ පොතුත් ගැන සිංහල පොත්පත්වල පළමුවරට සඳහන් වන්නේ දඹදෙණි යුගයේ දීය.

(i) මේ ඡේදයේ සඳහන් පරිදි විදේශීය ආක්‍රමණයෙන් පසුව ස්වාධීන පාලකයන් වශයෙන් කටයුතු කළෝ කවරහු ද?
(ii) වැඩි වූ ජනගහනයට ආහාර සැපයීම සඳහා යෙදූ උපක්‍රමය කුමක් ද?
(iii) මේ ඡේදයේ සඳහන් වන රජරට රාජධානිය අල්ලා ගත් ආක්‍රමණිකයාගේ නම කුමක් ද?
(iv) වියළි කලාපයේ සිට සංක්‍රමණය වූ පිරිසට අලුතින් ආහාරයට ගැනීමට සිදු වූ තෙල් වර්ගය කුමක් ද?
(v) කතුවරයා සඳහන් කරන අන්දමට පළමුවරට කුරුඳු පිළිබඳ සාක්ෂිය හමුවන්නේ කවර යුගයේ ද?

(ලකුණු 10 යි)

**5.** උතුරු සත්සිරිපුර ප්‍රදේශයට විදුලි බලය ලබා දීම සඳහා අදාළ විදුලි රැහැන් ඇදීම ආදි මූලික කටයුතු නිම කොට මාස දහයක් පමණ ගත වී ඇතත් තවමත් විදුලිබල සැපයුම ලබා දී නොමැත. පවුල් 200කට අධික පිරිසක් ප්‍රදේශයේ ජීවත් වන අතර, ඉන් බහුතරයක් මේ වන විටත් විවිධ ස්වයං රැකියා කටයුතුවල නිරත වෙමින් සිටිති. ඔවුන්ට මෙන් ම පාසල් සිසුනට ද විදුලිය ලැබීමෙන් ස්වකීය කාර්යයන් පහසු වනු ඇත. මේ කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වන සපුමල් බණ්ඩාර ඔබ යයි සිතා සත්සිරිපුර විදුලිබල මණ්ඩලයේ අධිකාරී වෙත, කඩිනමින් විදුලිබල සැපයුම ලබා දෙන ලෙස කෙරෙන ඉල්ලීම සහිත රාජකාරි ලිපියක් සකස් කරන්න.

**(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)**

**නැතහොත්**

ශාකවල විවිධ කොටස් වැනි දේශිය අමුද්‍රව්‍ය භාවිතයෙන් දර්ශනීය සුබපැතුම්පත් හා බිත්ති සැරසිලි ආදි විසිතුරු නිර්මාණ සකස් කිරීමට පුහුණු කිරීමේ වැඩමුළුවක් පසුගිය දා සමගිපුර සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. වැඩමුළුව අවසානයේ නිර්මාණ ප්‍රදර්ශනයක් ද සංවිධානය කෙරිණි. ප්‍රදර්ශනය නැරඹීමට ප්‍රදේශවාසීහු සහභාගි වූහ. දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරිතුමා ප්‍රධාන අමුත්තා විය. එතුමා ප්‍රදර්ශනය විවෘත කරමින් කළ කතාව හැමදෙනාගේම ප්‍රසංශාවට භාජනය විය. සමගිපුර මාණ්ඩලික වාර්තාකරු ඔබ යයි සිතා ඉහත කරුණු ආශ්‍රයෙන් පුවත්පත් වාර්තාවක් **සකස් කරන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

**(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)**

(ලකුණු 15 යි)

* * *

OL/2013/21-S-III

281459

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

1. **(i)** සිට **(x)** තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
ගමේ ඉඳන් ආවේ මම දෙකෙන් තුනට සමත් වෙලා."
(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මොනිකා රුවන්පතිරණ කිවිඳිය විසින් රචනා කරන ලද කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(ii) "රුපියලක් දෙකක් විතර. වැස්සොත් එහෙම කීයක් වත් නෑ."
(අ) මෙය පවසන්නේ කාට ද?
(ආ) මෙම පිළිතුර ලබා දෙන්නේ කුමක් විමසූ විට ද?

(iii) "මගේ පපුව ගිඩි ගිඩි ගාලා ගැහෙනවා"
(අ) මෙසේ පවසන්නේ කවරෙක් ද?
(ආ) කෙබඳු අවස්ථාවක දී ද?

(iv) "මම දෙදෙනා ම දිටිමි. එහෙයින් සත් දවසක් තොවෙයි."
(අ) මෙහි දෙදෙනා ම යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ගැන ද?
(ආ) ඒ දෙදෙනා ම දුටු තැනැත්තා කවරෙක් ද?

(v) (අ) එච්.එම්. කුඩලිගම සිය කාව්‍ය නිර්මාණ මුලින් ම යොමු කළේ කිනම් පුවත්පතකට ද?
(ආ) වැහි වළාකුළු දකින විට සතුටට පත්වන කුරුල්ලකු ගැන 'වැස්ස' කවිපෙළේ දැක් වේ. එම කුරුල්ලා නම් කරන්න.

(vi) (අ) හත්ත හත්තික සිටාණන්ගේ වස්තුවෙහි දැක්වෙන ගන්ධක සිටාණන්ගේ භාර්යාවගේ නම කුමක් ද?
(ආ) බත් බැළයා තුන් අවුරුද්දක් මෙහෙ කොට ලද බත් තලිය පූජා කළේ කාට ද?

(vii) (අ) කාව්‍යශේඛරයේ කියැවෙන ආකාරයට එය රචනා කර ඇත්තේ කාගේ ආරාධනයෙන් ද?
(ආ) කාව්‍යශේඛරයේ දැක්වෙන බමුණා සිය මිතුරා වෙත තබා ගිය මුදල කොපමණ ද?

(viii) "අතක් බෝසතුගෙ **ළෙයි** තබමින් විමසා
මදක් සැලි සැළී පණ නල තිබෙන තිසා"
(අ) මෙම පද්‍යයේ ඉතිරි පේළි දෙක ලියා දක්වන්න.
(ආ) තද කළු අකුරෙන් දැක්වෙන වචනයේ අර්ථය ලියන්න.

(ix) (අ) රහතන් වහන්සේ නමකට පිළිණි කඩු අලයක් දන් දීමේ පිනින් ඊළඟ ආත්ම භාවයේ දී නිධානයක් ලද අයකු ගැන කියැවෙන කථා වස්තුව නම් කරන්න.
(ආ) එම කතාව උපුටා ගෙන ඇත්තේ කිනම් ග්‍රන්ථයකින් ද?

(x) (අ) 'රන් තැටියක කඳුළු' සහ 'නොවඳිම් සිදුහතා' යන කාව්‍ය සංග්‍රහ රචනා කළ කවියා නම් කරන්න.
(ආ) 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාව කාගේ නිර්මාණයක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "නැගෙන සැණකෙළි හඬින් සිව්දෙස
**පිරී අබිසෙස්** ලැබී සොම්නස
විදුලි එළියෙන් පුරය **එකලූ ව**
අසිරිමත් සුර ලොවක් බිහිවිය"

(ii) "මෙවන් **දරිද්‍රතාවකින්** මතු වූ මිනිහකුගේ **උදාරත්වයට** මගේ මිත්‍ර කවියා හිස නමා සිටිය යුතු ය."

(iii) "කීයෙන් ඔහු මෙසේ
**අදහළ** නකත් දවසේ
පාවා දෙන ලෙසේ
පටන් ගෙන පියබමුණු **නොලසේ**"

(iv) "මෙතෙක් දවසේ **බැළ මේ** කරන ගමනේ එක දවසක්වත් අඩුවක් නොපෑ මෙහෙ කළ **නියාව** යහපත් ම යයි කිවූ ය."

(ලකුණු 05 × 04 = 20 යි)

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සෑහේ.

3. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාවේ සාර්ථකත්වය සඳහා මනා චරිත නිරූපණය ඉවහල් වී ඇති ආකාරය

(i) සිරියාවතීගේ චරිතය හා

(ii) සිරියාවතීගේ මවගේ චරිතය ඇසුරෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(ලකුණු 15 යි)

(i) උපමා භාවිතය හා

(ii) අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීම,

'වැස්ස' කවි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

4. (i) සරල භාෂා භාවිතයට සහ

(ii) මනා අවස්ථා නිරූපණයට,

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් දැක් වූ දක්ෂතාව කාව්‍යශේඛරයෙන් පිළිබිඹු වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

(ලකුණු 15 යි)

'සද්ධර්මාලංකාරය,

(i) ශ්‍රව්‍ය ගෝචර රචනා ශෛලියක් යොදා ගනිමින්

(ii) චිත්තාකර්ෂණීය ලෙස වර්ණනා ඉදිරිපත් කරන කෘතියකි.

උත්තරෝලිය වස්තුවෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට පමණක්** උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

5. මිනිසුන් දුප්පත්කමින් පීඩාවට පත් වීම නිරූපණය කිරීමේ දී කතුවරයා දක්වා ඇති සංවේදිතාව කෙබඳු වූවක් දැයි 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

6. අවුරුදු සමයේ දක්නට ලැබෙන පරිසරය විචිත්‍ර ලෙස වර්ණනා කිරීම, 'වසන්ත සමය' කවිපන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය උදාහරණ **තුනක්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි)

7. 'ජීවක කථා වස්තුව, යහපත් වෛද්‍යවරයකුගේ ගුණාංග ඉස්මතු කර දක්වන නිර්මාණයකි.' උදාහරණ **තුනක්** දක්වමින් පහදන්න.

(ලකුණු 10 යි)

* * *

The National e-learning Portal for The General Education